# උඩරට රාජධානි සමයේ ආරක්ෂාවට යොදාගත් පැරණි සටන් ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

අයි.පී.එන්. උදයංගනී

පාරිසරික කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nilushikaudayangani15@gmail.com

ප්‍රමුඛ පද: ආත්මාරක්ෂාව, මහනුවර, යුද්ධායුධ, සටන් ක්‍රම

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පාරම්පරික සටන් කලාව සිංහලයාගේ සංස්කෘතියේ එක් අංගයකි. මෙහි ආරම්භය පිළිබඳ නිශ්චිත අදහසක් නොමැත. ඕනෑම රාජ්‍යයක ආරක්ෂාව සඳහා විවිධ සටන් ක්‍රම යොදාගෙන ඇත. විශේෂයෙන් ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම ආත්මාරක්ෂාවට මිනිසා විවිධ ආයුධ භාවිතයට නැඹුරු විය. ක්‍රමයෙන් මෙම ආයුධ විකාශනය වී ශ්‍රී ලංකාව ජනාවාසකරණ අවධිය වනවිට මිනිසුන් සමූහයක ආරක්ෂාව පිණිස විවිධාකාරයේ සටන් ක්‍රම භාවිත කර ඇත. උඩරට රාජ්‍ය සමයේ ආරක්ෂාවට යොදාගත් පැරණි සටන් ක්‍රම කවරේද යන අධ්‍යයන ගැටලුව ඔස්සේ එම සටන් ක්‍රම භාවිත කළ අවස්ථාවන් හඳුන්වාදීම මූලාශ්‍රගත තොරතුරු අධ්‍යනය කිරීම තුළින් ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන උක්ත අධ්‍යයන මාතෘකාවට කරුණු ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

## ක්‍රමවේදය

දත්ත එක්රැස් කර ගැනිමේ දී ප්‍රාථමික හා ද්විතියික සාහිත්‍ය මූලාශ්‍රයන් ද්විත්වයම පරිශීලනය කරනු ලැබෙයි. එසේම මේ වනවිට උක්ත කාලපරිච්ඡේදය සම්බන්ධව සිදුකර ඇති පර්යේෂණ නැවත අධ්‍යනයට ලක්කරන අතර ඒවා මඟින් ද තොරතුරු ලබා ගැනීම මූලිකව සිදු කරනු ලබයි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ අනුරාධපුර රාජධානිය ආරම්භයේ සිට මහනුවර රාජධානි සමය දක්වා ආරක්ෂාව සඳහා විවිධ වූ සටන් ක්‍රම භාවිත කර ඇති බව මූලාශ්‍රයන් සනාථ කරයි. මෙම ආරක්ෂක සටන් ක්‍රම විකාශනය වී උපරිමයට පත්වූ අවධියක් ලෙස මහනුවර යුගය දැක්විය හැකිය. එයට හේතුව වූයේ පාරම්පරිකව ලත් අත්දැකීම් මත පෝෂණය වී ක්‍රමානුකූලව එය අත්‍යවශ්‍ය අංගයක් වූ නිසාය. විශේෂයෙන් මහනුවර රාජධානියේ භූගෝලීය සාධක මෙම සටන් ක්‍රම සාර්ථක කර ගැනිමට ඉවහල් වී ඇත. වර්තමානයේ මෙන් දියුණු තාක්ෂණයක් නොපැවති අතීතයේ සටන් ක්‍රම අත්‍යවශ්‍ය අංගයක් විය. අභ්‍යන්තර මෙන්ම බාහිර ගැටලුවල දී රාජ්‍යයේ ආරක්ෂාවට මෙම සටන් වැදගත් විය. මේවා රාජධානියෙන් රාජධානියට වෙනස් වූයේද යන්න සැක සහිතය. කඩුව, දුන්න, ඊතලය, හෙල්ලය, පොරෝව වැනි ආයුධවලින් මුල්කාලීන සටන් පැවතී ඇත. නමුත් පසුකාලීනව මහනුවර රාජධානි සමය වනවිට බයිනෙත්තු (තුවක්කු) යොදාගෙන සටන් කිරීමට සිංහල ජනයා පුරුදු විය.

මහනුවර යුගයේ සාමාන්‍ය භේවායන්ගේ ස්වභාවය පිළිබඳ දක්වන රොබට් නොක්ස්ගේ වාර්තා අනුව භේවායන්

පිටතට යනවිට ආහාර සහ පැන් බඳුන් පිට තබාගෙන කඩු, හෙල්ල, දුනු, හී, තුවක්කු අතින් ගෙන ගිය බව දැක්වේ. එය හේවායන්ට මහත් අපහසුවක් වූ බවද දක්වා ඇත. නමුදු සතුරන් අඩපන කිරීමේ දී ගස්ගල් අතර තුවක්කු බැඳ සැඟව සිටිබව මෙන්ම තුවක්කු කරතබාගෙන ගල්වලට මුවාවී සතුරා විනාශ කිරීමට හැකි සෑමවිටම උත්සාහ කළ බවද දක්වයි. මහනුවර යුගයේ ආරක්ෂාවට යොදාගත් සටන් ක්‍රම පිළිබඳව දැක්වීමේ දී

- දුනු සටන් ක්‍රමය
- කඩු සටන් ක්‍රමය
- ගරිල්ලා සටන් ක්‍රමය
- කලා කිරිඤ්ඤය
- අංගම්පොර සටන්

ආදී වශයෙන් වූ සටන් ක්‍රම උපයෝගී කරගත් බව දැක්විය හැකිය. මෙම සටන්වල දී අවි භාවිතා කරමින් මෙන්ම නොකරමින්ද සටන් කර ඇත.

පුරාණයේ සිට බෙහෙවින් ප්‍රචලිත දුන්න ප්‍රමුඛ සටන් කලාව දුනු සටන් කලාව ලෙස හඳුන්වයි. මහනුවර යුගයේ ඉතා ජනප්‍රිය ආරක්ෂිත ක්‍රමවේදයක් හා සටන් ක්‍රමයක් ලෙස ද මෙය පැවති බව පෙනේ. දඹදෙණි අස්න, චුල්ලදනුග්ගහ ජාතකය, ධම්පියා අටුවා ගැටපදය වැනි මූලාශ්‍ර අධ්‍යයනයේ දී දුනු ශිල්පය පිළිබඳ තොරතුරු ලබාගත හැකිය. ඇතැම් විට දුන්න උදෙසා යොදා ගනු ලැබූ ඊතල විෂ පොවන ලද බවට මූලාශ්‍රයන් තුළින් පෙන්වා දේ. මෙම දුන්න ද මනුෂ්‍යයාගේ ශරීර ස්වභාවය අනුව ප්‍රමාණයෙන් වෙනස් වූ බව මහ දුන්න, මිටි දුන්න ආදි දුනු වර්ග හඳුන්වන ලද නාමයන්ගෙන් පැහැදිලි වෙයි.

කඩු සටන්වල දී යොදාගන්නා කඩුව යුද්ධායුධයක් ලෙසත් අවි හරඹයෙහි ප්‍රයෝජනයට ගත් ආයුධයක් ලෙසත් හැරෙන්නට රාජ්‍ය උත්සවවලදීත් ගෞරව පිරිනැමීමේ දී ප්‍රදාන කරන තිළිණ ලෙසත් භාවිත විය. මුහුණට මුහුණලා සටන්වල දී මෙය ප්‍රධාන ස්ථානයක් ගනී. විශේෂයෙන් ධනු ශිල්පය මෙන්ම කඩු ශිල්පය රජ කුමරුන්ගේත්, කුල දරුවාගේත් අධ්‍යාපනයේ අංගයක් විය. මෙහි දී පුහුණුව අත්‍යවශ්‍යය. ආයුධ අභ්‍යාස පෙර රජවරුන්ගේ දින චර්යාවේ එක් අංගයක් බව කදවුරු සිරිතේ සඳහන් වේ. ඉන්දියාවේ හා ලංකාවේ පසු කලෙක දියුණුව පැවති අංගම් පොරයෙහි ප්‍රධාන තැනක් කඩුවට හිමි වූ බව දඹදෙණි අස්න හා පූජාවලියේ දැක්වේ. රජතුමාගේ ප්‍රධාන ආයුධය කඩුව වූ බැවින් කඩු සටන් අනෙකුත් යුගවල මෙන්ම මහනුවර යුගයේ ද ප්‍රධාන ආරක්ෂක ක්‍රමවේද අතරට එක් වූ බව කිවහැක.

ගරිල්ලා සටන් ක්‍රමය පිළිබඳ දැක්වීමේ දී සැඟව සිට පහර දීම ලෙසට අර්ථකතනය කළ හැකිය. මෙය ඉතා සූක්ෂම ලෙස පුරුදු පුහුණු වියයුතු වේ. අවි ආයුධ භාවිතයෙන් තොරව සතුරා සමඟ සටන් කිරීම වැදගත් වේ. විශේෂයෙන් මහනුවර රාජධානියේ ආරක්ෂාවට ඉතාම වැදගත් වී ඇති මෙම සටන් ක්‍රමය සාර්ථක වීමට මහනුවර රාජධානියේ ස්වාභාවික පිහිටීම ද හේතු වී ඇත. විශේෂයෙන් ඉංග්‍රීසින් කිහිප වතාවක්ම පරාජය කිරීමට මෙම ගරිල්ලා සටන් ක්‍රමය නිසා හැකියාව ලැබී ඇති බව මූලාශ්‍රයන් අධ්‍යයනයේ දී පැහැදිලි වෙයි. උඩරට ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා තම ආරක්ෂාව පිණිස කඳුකරයේ සැඟවී සිටි බවට සාධක ඇත. තවද II රාජසිංහ රජු 1664 දී ආරක්ෂාව සඳහා අඹන්වෙල රාලගේ මූලිකත්වයෙන් ඇති වූ කැරැල්ල අවස්ථාවේ හැංගුනේ හගුරන්කෙත ගලඋඩ කන්දට ගොසිනි. මෙලෙස රජුගේ ආරක්ෂාව සහතික කළේ ගරිල්ලා සටන් ක්‍රමය මඟිනි. විශේෂයෙන් සතුරා සතු ශක්තිය අඩපණ කරලීම සඳහා ඔවුන්ට පරිබාහිරෙන් ලැබෙන ආධාර සතුරා දුර්වල වූ පසු ක්ෂණික පහර දීමට ගරිල්ලා සටන් ක්‍රමය වැදගත්

වූ බව පෙනේ. මෙහිදී සතුරා මුසපත් කොට බියගැන්වීම, වටකොට සැඟව සිට ප්‍රහාර එල්ල කිරීම, මාර්ගවල මර උගුල් ඇටවීම වැනි විවිධ වූ උපක්‍රම වැදගත් වේ.

නූතනයේ බොක්සිං ක්‍රීඩාවට සමානව මහනුවර යුගයේ පැවති සටන් ක්‍රමයක් ලෙස කලාකිරිඤ්ඤයක් අතෙහි දරා සටන් කිරීම හඳුනාගත හැකි ය. අතමිට මොලවා දෙන පහරක් එහි වේගවත් බව, අනතුරු බව වැඩි කිරීමට කලාකිරිඤ්ඤයක් භාවිත කිරීමෙන් හැකි වී යැයි සිතිය හැකිය. මෙය මී හරක් අංවලින් නිෂ්පාදනය කරනු ලැබීමත්, නිර්මාණය පහසු වීමත් හේතුවෙන් බහුල වශයෙන් එකල ආරක්ෂකයන් අතර පැවතියේ යැයි කිව හැකිය.

මහනුවර යුගයේ සිට පැවත එන සටන් ක්‍රම අතරින් වර්තමානයේ ද ප්‍රචලිත සටන් කලා අතරට අංගම්පොර සටන් කලාව ප්‍රධාන වේ. අංගම්පොර යනු ශාරිරික පොර යන්න අදහස් කරයි. අංගම් ශාස්ත්‍රය යනු ශරිරය පිළිබඳ විද්‍යාවයි. අංගම් හරඹ හෙවත් කොටස් බොහෝ බව මෙම සටන් කලාව පිළිබඳ අධ්‍යයනයේ දී පැහැදිලි වෙයි. මේ පිළිබඳ අධ්‍යයනයේ දී චූලවංශය, රාජාවලිය, 15වන සියවසට අයත් රාජකීය තඹ සන්නස හා මහාවංසය වැනි මූලාශ්‍ර ග්‍රන්ථ වැදගත් වේ. මෙය ආත්මාරක්ෂක සටන් කලාවක් ලෙස පමණක් නොව සටන් සන්දර්ශන ලෙස ද පවත්වා ඇති බව පෙනේ. රාවණා යුගය තුළ දී ඉතාම ප්‍රසිද්ධ සටන් කලාවක් ලෙස ද මූලාශ්‍රවල දැක්වෙයි. මෙම සටන් කලාවේ දී නිල ශාස්ත්‍රය පිළිබඳ දැනුම ඉතාම වැදගත් වේ.

ක්‍රි.ව. 1505 සිට ක්‍රි.ව. 1915 දක්වා පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ මෙම සටන් ක්‍රම වැදගත් වූ බව පැහැදිලි වේ. නමුදු ක්‍රි.ව. 1915 න් පසු මෙම සටන් ක්‍රමවල යම් පරිහානි තත්වයක් හඳුනා ගත හැකිය. මීට හේතුව රටේ ජනතාව ආයුධ අතට නොගෙන සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්නවලට විසඳුම් සෙවීමයි. මේ අනුව ජාතික ව්‍යාපාර කෙරෙහි අවධානය යොමුකළ බව පැහැදිලි වේ. සටන් කලාවේ පිරිහීම ආරම්භ වුවද පසු කාලීනව මේ අතරින් කඩු, දුනු, අංගම්පොර සටන් ක්‍රීඩා බවටත් පත් වී ඇති ආකාරයත් වර්තමානයේ දී හඳුනාගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


ගමගේ, පී.ඇස්. (1997)***මහනුවර යුගයේ ආරක්ෂක ක්‍රමෝපාය.***කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දැරණියගල, පී.ඊ.පී. (2005)***සිංහල ත්‍රාසජනක ක්‍රීඩා.*** ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.